# ශ්‍රී ලංකා දුම්රිය සේවය

## ලංසු ආරාධනය

### Y CLASS SHUNTING LOCOMOTIVES WITH COMPRESSED AIR BRAKE SYSTEM – 02ක් සැලසුම් කිරීම සහ වෙනස් කිරීම සඳහා ප්‍රසම්පාදනය

### IFB No. - SRS F. 8077

1. ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් Y CLASS SHUNTING LOCOMOTIVES WITH COMPRESSED AIR BRAKE SYSTEM – 02ක් **සැලසුම් කිරීම සහ වෙනස් කිරීම සඳහා ප්‍රසම්පාදනය සැපයීම** වෙනුවෙන් දේශීය නිෂ්පාදකයන්/ සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවා සිටී.

2. ලංසු කැඳවීම ජාතික තරඟකාරීත්ව ලංසු පටිපාටිය (NCB) අනුව සිදු කෙරෙනු ඇත.

3. උනන්දුවක් දක්වන යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ට **2024.11.28** සිට **2024.12.23** දක්වා **පෙ.ව.9.00** සිට **ප.ව.3.00** දක්වා වැඩ කරන දිනයන්හිදී පහත දක්වා ඇති ලිපිනයෙන් වැඩි දුර තොරතුරු ලබාගැනීමට සහ ලංසු ලේඛන පරීක්ෂා කිරීමට හැකිය.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන),**
**දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,**
**ඕල්කට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.**
**දුරකථන අංක : +94 (11) 2438078 හෝ +94(11) 4600202**
**ෆැක්ස් අංකය : +94(11) 2432044**
**ඊ මේල් : srs.slr@gmail.com , tender1@railway.gov.lk**
**වෙබ් අඩවිය : www.railway.gov.lk**

4. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට **2024.11.28** සිට **2024.12.23** දක්වා **ප.ව.3.00** තෙක් නැවත ගෙවනු නොලබන **රු.27,500/-** ක ප්‍රසම්පාදන ගාස්තුවක් ගෙවා ලිඛිත අයදුම්පත්‍රයක් දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තු කාර්යාලය, ඕල්කට් මාවත, කොළඹ 10 යන ලිපිනයට යොමු කිරීමෙන් ඉංග්‍රීසි භාෂාවෙන් ඇති සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිල දී ගත හැකිය.

5. සෑම ලංසුවක්ම ලංසු සුරක්ෂණයක් සමග ඉදිරිපත් කළ යුතු ය. ලංසු සුරක්ෂණ මුදල **රු.1,500,000.00** ක් විය යුතු අතර, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් අනුමත ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන බැංකුවක් විසින් නිකුත් කළ කොන්දේසි විරහිත ලංසු ඇපකරයක් විය යුතුය.

6. පෙර ලංසු රැස්වීම **2024/12/09 දින පෙ.ව.10.00 ට** රත්මලාන ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු කාර්යාලයේදී පැවැත්වේ.

7. **2024.12.24** දින **ප.ව.2.00** හෝ එදිනට පෙර පහත ලිපිනයට ලංසු එවිය යුතු අතර ලංසු භාරගැනීම අවසන් වූ වහාම විවෘත කරනු ලැබේ. කොළඹ 10, ඕල්කට් මාවත, තැ.පෙ. 1347, දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,3 වැනි මහලේ කාමර අංක 01 හිදී මෙම ලංසු විවෘත කරන අතර ලංසු විවෘත කිරීමේදී පෙනී සිටින මෙන් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් වෙතින් ඉල්ලා සිටිනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන ලංසු භාරගනු නොලැබේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),**
**ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තු කාර්යාලය,**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය,**
**ඕල්කට් මාවත, කොළඹ 10.**

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
**ශ්‍රී ලංකා දුම්රිය සේවය.**
යොමු අංකය : SRS/ F.8077